# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ජී. ජී. බේබිනෝනා
179/3
සේරුසිංහ මාවත,
විජයබාපුර,
පොළොන්නරුව

**අභියාචක**

**අභියාචනා අංකය : 889/2021** එදිරිව

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
4 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක නැත. පෙනී සිටිමක්ද නැත
පොදු අධිකාරිය නැත. පෙනී සිටිමක්ද නැත

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.03.24, 2022.06.03, 2022.08.09

**තීරණය කළ දිනය** : 2022.08.09

**තීරණය :**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2021.02.19 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"2000 වර්ෂයේදී මා හට සහ මාගේ සැමියා වන ජී.ජී.රණදේව යන අයට ගිණුම් අංක 26/408 සහ සාමාජික අංක 1705/4/26/12 යටතේ සමෘද්ධි දීමනා පත්‍රයක් ලබා දී තිබුණි.*
*2016/03/23 දින මාගේ සැමියා මියගිය අතර මා හට හිමි සමෘද්ධි දීමනාව ලබා ගැනීමට ගිය අවස්ථාවේ එය G.G.නන්දාවතී වන මාගේ සැමියාගේ අනියම් බිරිඳගේ නමට හරවා ඇති බව දැනගැනීමට ලැබුනි.*
*මෙලෙස මා වෙත කිසිදු දැනුම් දීමකින් තොරව මා හට අයත් සමෘද්ධි දීමනා පත්‍රය වෙනත් අයෙකුට පැවරුවේ කෙසේද? යන්න මා වෙත තොරතුරු ලබා දෙන්න. "*

තොරතුරු නිලධාරි පනතේ දක්වා ඇති නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.03.12 දිනැතිව නම්කළ නිළධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරී විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2021.05.18 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

## සළකා බැලීම

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24 වන වගන්තිය යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, පනතේ 31 වන වගන්තිය යටතේ අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

උක්ත තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති කිසිදු තොරතුරක් පනතේ 5(1) වගන්තියෙහි ව්‍යතිරේඛයන්ට හසු නොවන බැවින් කිසිදු වාරණයකින් තොරව අභියාචක වෙත මුදා හැරීමේ හැකියාව පොදු අධිකාරිය සතු වන බව පැහැදිලිව පෙනී යයි. එබැවින්, ඉහත කී තොරතුරු ඉල්ලීමේ සඳහන් සියලුම තොරතුරු 2022.09.09 දිනට ප්‍රථම කොමිෂන් සභාවට පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කල යුතු බවට අපි තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට  කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.